**කොළඹ දිස්ත්‍රික් ගොවිජන සේවා කාරක සභා 9 - 2023**

---

**1. විගණන මතය**

**1.1** කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09 හි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 09හිම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණු අතර, මේ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 21 (ඇ) ඡේදය ප්‍රකාරව ගොවිජන සේවා කාරක සභා 05ක් විසින් ශුද්ධ වත්කම්/ස්කන්ධයේ වෙනස්වීමේ ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලය විසින් හඳුන්වා දුන් මූල්‍ය ප්‍රකාශන ආකෘති තුළ එය ඇතුළත්ව නොමැති බව කහතුඩුව ගොවිජන සේවා කාරක සභාව දන්වා ඇති අතර අනෙකුත් කාරක සභා විසින් ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 02ක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සියල්ල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර අදාල කරගත් ගිණුම්කරණ සංකල්ප කීපයක් පමණක් අනාවරණය කර තිබුණි. | ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන සෑදීමේ දී ගිණුම්කරණ ප්‍රතිපත්ති සියල්ල ප්‍රකාශ කිරීමට කටයුතු කරන බව පාදුක්ක ගොවිජන සේවා කාරක සභාව දන්වා ඇති අතර හෝමාගම ගොවිජන සේවා කාරක සභා විසින් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | - එම - |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හෝමාගම සහ මහරගම ගොවිජන සේවා කාරක සභා දෙකට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට තොග සත්‍යාපන වාර්තාව අනුව විවිධ තොගවල මුළු එකතු වටිනාකම රු.1,765,893ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට එම තොගයන්ට අදාළ එකතුව රු.2,601,013ක් සඳහන් කර තිබිමෙන් වර්ෂ අවසාන වටිනාකම රු.835,120 ක් වැඩියෙන් දක්වා තිබුණි. | හෝමාගම ගොවිජන සේවා කාරක සභාවට අදාල තොග අතර වෙනස වු රු.813,820ක් සම්බන්ධයෙන්, තොග ගබඩාවේ වහලය කඩා වැටීම නිසා ගබඩාවේ දොර විවෘත කර තොග සත්‍යාපනය කිරීමට නොහැකි විමත්, කල් ඉකුත් වූ තොගයන් පැවතීම හා වියළි කාලගුණික තත්වයන්ට හසුවීමෙන් හා මාර්ග සංවර්ධනයේදී පැල කොටුව කඩා ඉවත් කිරීම හේතුවෙන් පැල මැරී යාම සිදුවී ඇත බව සහ මහරගම ගොවිජන සේවා කාරක සභාව විසින් අත්වැරදිමකින් තොගය වැරදි ලෙස සටහන් වී ඇති බව. | තොග අගයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | හෝමාගම ගොවිජන සේවා කාරක සභාවට අදාලව 2015 වර්ෂයට පෙර සිට කල් ඉකුත් වූ එකතුව රු.417,696ක් වූ තොග හඳුනාගත නොහැකි පරිදි විනාශ වී ඇති නමුත් තොග පොත්වලින් ඉවත් කිරීමෙන් තොරව 2023 දෙසැම්බර් 31 දිනට වු තොගයේ ඇතුළත්ව පැවතුණි. | පොත්වලින් ඉවත් කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇති බවද අනුමැතිය ලද පසු ඉවත් කිරීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතිය යටතේ ගැලපීම් කර මූල්‍ය ප්‍රකාශනවල තොග අගයන් නිවැරදිව දැක්විය යුතුය. |
| (ඇ) | ගිණුම්කරණ මෘදුකාංගය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ගෙවන ලද රු.194,250ක මුදල, ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත නොකර කැස්බෑව ගොවිජන බැංකුව විසින් වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගලපා තිබුණු අතර පාදුක්ක හා කොස්ගම ගොවිජන බැංකුව විසින් එම මුදල සමුච්චිත අරමුදල් ශේෂයට ගලපා තිබුණි. | 2024 ගිණුම් වාර්තාවේ දී නිවැරදිව ඉදිරිපත් කරන බව. | නිවැරදි ගිණුම් ක්‍රමවේද අනුගමනය කළ යුතුය. |

### 1.3.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 03ක ගිණුම් විෂයයන් 18 කට අදාලව මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අතර ශේෂයෙහි එකතුව රු.943,609ක නොසැසඳීම් පැවතුණි. | කරුණු සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නොසැසඳීම්වලට අදාල හේතු පරීක්ෂාකර නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක් ගොවිජන සේවා කාරක සභාවක වසර 10කට පෙර සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුම් හර ශේෂය රු.222,621ක් හා රු.260,839ක අවිනිශ්චිත ගිණුමක බැර ශේෂයක් සහ තවත් ගොවිජන සේවා කාරක සභාවක වසර දෙකක සිට ඉදිරියට ගෙන එන රු.254,065ක අවිනිශ්චිත ගිණුම් හර ශේෂයක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී සොයා බලා නිරවුල් කිරිමට කටයුතු කරන බව. | මෙම අවිනිශ්චිත ගිණුම් ශේෂයන් වසර ගණනක් සිට පැවත එන බැවින් මෙම අවිනිශ්චිත ගිණුම් ශේෂයන්ට හේතු කඩිනමින් සොයාබලා ගිණුම් නිවැරදිකිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 9ක රු.29,025,219ක ස්ථාවර වත්කම් පැවතුණද, එම ශේෂ සනාථකිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛන ද, ගොවිජන සේවා කාරක සභා 05ක රු.3,355,408ක ණයහිමි ශේෂ සහ කාරක සභා 03ක රු.1,703,293ක ණයගැති ශේෂ පැවතියද එම ශේෂ සනාථකර ගැනීම සඳහා ශේෂ සනාථකිරීම් හා කාල විශ්ලේෂණද, එක් ගොවිජන සේවා කාරක සභාවක එකතු වටිනාකම වූ රු.1,105,978කට අදාල ස්ථාවර තැන්පතු, කාමර කුලී, ඇප තැන්පතු හා ණයට විකුණුම් සම්බන්ධයෙන් අදාල ලේඛන නොතිබීම හේතුවෙන් එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට / සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ඉදිරි ගිණුම් වාර්තා සැකසීමේදි අදාල විස්තරාත්මක ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | වත්කම් හා වගකිම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඉ) උප වගන්තිය | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවක් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දිය යුතු වුවත් හෝමාගම සහ මාලබේ ගොවිජන සේවා කාරක සභා 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විමසීම් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | විගණන පනත ප්‍රකාරව පිළිතුරු ලබා දීය යුතුවේ. |
| (ආ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| (i) 14 වගන්තිය | තොරතුරු සොයාගත නොහැකි වීමෙන් අද ගොවියා විසින් ඉඩම් හිමියාට ගෙවිය යුතු ප්‍රවේණිය ලෙස ඉකුත් වර්ෂවලදී කොස්ගම, කහතුඩුව හා මහරගම ගොවිජන සේවා කාරක සභාවලට ලැබී තිබුණු පිළිවෙලින් රු.11,462ක්, රු.291,939ක් හා රු.9,642ක් පනතේ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කොස්ගම ගොවිජන සේවා කාරක සභාව විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ උපදෙස් ඉල්ලා ඇති බවද, කහතුඩුව ගොවිජන සේවා කාරක සභාව විසින් නඩු කටයුතු නිමවන තෙක් නිරවුල් කළ නොහැකි බවද, මහරගම ගොවිජන සේවා කාරක සභාව විසින් ඒ සම්බන්ධව පැවති නඩුවෙහි නඩු තීන්දුව මේවන විට මධ්‍යස්ථානයට ලැබී ඇති බවත් ඉදිරියේදි නිරවුල් කිරීම් සිදුකරන බව. | ගොවිජන සංවර්ධන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ii) 53(4)(අ) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 09ක ඉඩම් ලේඛන වසර 03 කට වරක් කොමසාරිස් ජනරාල් විසින් පරීක්ෂා කර සහතික කර නොතිබුණි. | සියලුම ගොවිජන සේවා කාරක සභා විසින් එකගත්වය දක්වා ඇති අතර ඉදිරියේදි එසේ කටයුතු කරන බව. | ගොවිජන සංවර්ධන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු. රෙ. 134 (3) | කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා හතක් සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ අභ්‍යන්තර විගණන පරීක්ෂණවල වාර්තා පිටපත් විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) මු.රෙ. 757 (2) (අ) | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව ලැබීමෙන් පසු එහි පිටපතක් වහාම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය යන්න දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයට අදාලව ගොවිජන සේවා කාරක සභා 08 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණය දිස්ත්‍රික් කාර්යාලය විසින් සිදු කරන බව සහ එම වාර්තා ලැබුණු පසු පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (iv) මු.රෙ. 880 හා 881 | ගොවිජන සේවා කාරක සභා 02 ක භාණ්ඩ හා මුදල් භාරව කටයුතු කරන, චෙක්පත් අත්සන් කරනු ලබන නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි අනුව ඇප තැන්පත් කළයුතු වුවද නිලධාරින් විසින් එ් අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඇප තැන්පත් කිරීමට කටයුතු කරන බව. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 07 ක එකතුව රු.5,809,294 ක අතිරික්තයක්ද, ගොවිජන සේවා කාරක සභා 02 ක එකතුව රු.784,396 ක ඌණතාවයක් වශයෙන් සමස්ථ එකතුව රු.5,024,898 ක අතිරික්තයක් සහ ගොවිජන බැංකු 09 හි එකතුව රු.4,352,487 ක අතිරික්තයක්ද විය. 2022 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 09 හි එකතුව රු.7,095,770 ක අතිරික්තයක්ද, ගොවිජන බැංකු 09 හි එකතුව රු.2,614,123 ක අතිරික්තයක්ද විය.

#### 2.1.1 විශ්ලේෂණාත්මක සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයේදී ගොවිජන සේවා කාරක සභා 07 ක එකතුව රු.5,809,294 ක අතිරික්තයක්ද, ගොවිජන සේවා කාරක සභා 02 ක එකතුව රු.784,396 ක ඌණතාවයක් වශයෙන් එකතුව රු.5,024,898 ක අතිරික්තයක් ලබාගෙන තිබූ අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේදී ගොවිජන සේවා කාරක සභා 09 ක අතිරික්තය රු.7,095,770 ක් විය. ඒ අනුව අතිරික්තයේ රු.2,070,877 ක අඩුවීමක් දක්නට විය. මෙම අඩුවීමට මහරගම, හෝමාගම සහ

ජයවර්ධනපුර කෝට්ටේ ගොවිජන සේවා කාරක සභාවල අතිරික්තය ඉකුත් වර්ෂයට වඩා අඩුවීම සහ කොලොන්නාව සහ කහතුඩුව ගොවිජන සේවා කාරක සභාවල ඌණතාවය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) ගොවිජන සේවා කාරක සභාවල මූලික කාර්යභාරයක් ලෙස පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය, බීජ සහ පැළ, කෘෂි උපකරණ ඇතුළු කෘෂි කාර්මික භාණ්ඩ අලෙවි කිරීම වන අතර සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජන සේවා කාරක සභා 09 ම මුළු අලෙවියේ එකතුව රු.29,300,673 ක් සහ මුළු දළ ලාභය එකතුව රු.2,282,878ක් ලබාගෙන තිබූ අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේදී ගොවිජන සේවා කාරක සභා 09 ක මුළු අලෙවියේ එකතුව රු.35,678,090 ක් සහ මුළු දළ ලාභය එකතුව රු.3,059,825ක් වූයෙන් ඉකුත් වර්ෂයට වඩා මුළු අලෙවියේ රු.6,377,417ක් සහ දළ ලාභය රු.776,947ක් අඩුවීම දක්නට ලැබුණි.

(ඇ) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 09 හි මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| <u>මූල්‍ය වත්කම්</u> | රු. |
| ජංගම වත්කම් | 55,541,829 |
| ජංගම නොවන වත්කම් | 48,239,373 |
| <u>මුළු වගකීම්</u> | |
| ජංගම බැරකම් | 41,029,732 |
| දිගුකාලීන ණය වටිනාකම | 9,515,828 |
| සමුච්චිත අරමුදල් වටිනාකම (ශුද්ධ වත්කම) | 53,235,642 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 තැන්පත් ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03ක පවතින ජංගම බැංකු ගිණුම් 04 ක් අක්‍රිය තත්වයේ පැවති අතර එම ගිණුම්වල 2023 දෙසැම්බර් 31 දිනට රු.541,682 ක ශේෂයක් පැවතුණි. | පාදුක්ක ගොවිජන සේවා කාරක සභාව විසින් එකී ශේෂය ඉතිරිකිරීමේ ගිණුමට බැර කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව සහ අනෙක් ගොවිජන කාරක සභා විසින් පිළිතුරු ලබාදී නොමැත. | අක්‍රිය බැංකු ගිණුම් තවදුරටත් පවත්වාගෙන යාමට අවශ්‍යතාවයක් නොමැති නම් එම ගිණුම් විධිමත් අනුමැතියක් මත අවසන් කිරීමට කටයුතු කිරීම. |
| (ආ) | කාරක සභා 9 තුළ කිසිදු පොලී ආදායමක් නොලබන ජංගම ගිණුම්වල රු.14,258,343ක ශේෂයක් පැවතුණි. | පිළිතුරු ලබාදී නොමැත. | විධිමත් අනුමැතියක් මත අරමුදල් වඩාත් ඵලදායි ආයෝජන මාර්ගයක යෙදවිය යුතුය. |
| (ඇ) | කාරක සභා 9 ට අදාළ එකතුව රු.29,725,656 ක මුදලක් අඩු පොලී ආදායමක් ලබන ඉතුරුම් තැන්පතුවල ආයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත. | - එම - |

## 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අභ්‍යන්තර විගණනයක් මගින් අනාවරණය වී ඇති කොස්ගම ගොවිජන බැංකුවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරිය විසින් කර තිබූ බවට වාර්තා වූ රු.483,664 ක මූල්‍ය වංචාවලට අදාල එම නිලධාරිනියගෙන් එකී මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතු වුවද, මෙම මූල්‍ය වංචාව අනාවරණය වී වසර 08 කටත් වඩා වැඩි කාලයක් ගතව ඇතත් නිලධාරිනියට එරෙහිව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 29.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු සිදු කර නොතිබුණි. | මූලික විමර්ශනයක් සිදුකර ඇති බවද මුදල් අයකර ගැනීමෙන් පසු ගිණුම් වාර්ථා නිවැරදි කරන බව. | අභ්‍යන්තර විගණන වාර්තා මගින් හඳුනාගෙන තිබුණු මූල්‍ය වංචා සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | කෝට්ටේ ගොවිජන සේවා කාරක සභාවට අදාලව සිදු කරන ලද අභ්‍යන්තර විගණනයක් මගින් අනාවරණය කර තිබුණු රු.764,838ක තොග ඌණතාවයෙන් රු.81,623ක් වගකිවයුතු නිලධාරින්ගෙන් අයකරගෙන ඇතත්, ඉතිරි තොග ඌණතාවය වන රු.683,215 ක් අයකරගෙන නොතිබුණි. තවද, ගොවිජන බැංකුවේ සිදුවී තිබුණු රු.564,741ක මූල්‍ය වංචාව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 පරිදි කටයුතු කර වගකිව යුතු නිලධාරින්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, රු.444,741ක් ලෙස එම මූල්‍ය වංචාවේ වටිනාකම පමණක් ගිණුම්වල දක්වා තිබුණි. | තොග ඌණය පිළිබද විධිමත් පරීක්ෂණයකින් වගකිව යුතු නිලධාරීන් හෙළිදරව් කර ගෙන නොමැති බැවින් ඉදිරි ක්‍රියා මාර්ග පිළිබද අවශ්‍ය උපදෙස් ඉල්ලා සිටින බව. | හඳුනාගෙන තිබුණු මූල්‍ය වංචා සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂන පවත්වා වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 03 ක බීජ, කෘෂි රසායන, පොහොර හා පැල වලට අදාලව රු.274,888ක්ද, ගොවිජන සේවා කාරක සභා 04 ක ගොවීන් වෙත බෙදාදීම සඳහා ලැබී තිබුණු කාබනික දියර පොහොර ලීටර් 2993ක්, හා ජෛව දියර පොහොර | කපා හැරීමට අනුමැතිය ඉල්ලා ඇති බව. | කාරක සභාව සතු අලෙවි ද්‍රව්‍ය හා පොහොර විධිමත් වැඩපිළිවෙලක් යටතේ අලෙවි කිරීමට කටයුතු සම්පාදනය කළ යුතුය. |

ලීටර් 457ක් කල් ඉකුත්වී භාවිතයට ගත නොහැකි වී තිබුණි

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1977 වර්ෂයේ ආරම්භ කර ඇති කෝට්ටේ ගොවිජන සේවා මධ්‍යස්ථානය පිහිටා ඇති ගොඩනැඟිල්ල හා භූමියෙහි අයිතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. එමෙන්ම කහතුඩුව ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් ඉඩම තාවකාලිකව පොලිස් ස්ථානය සඳහා පවරාගෙන තිබුණු අතර විවිධ අවස්ථාවල අදාල පාර්ශව අතර ලිපි හුවමාරු වී තිබුණද එම ඉඩම කහතුඩුව ගොවිජන සේවා මධ්‍යස්ථානයට ආපසු පවරා දී නොතිබුණු අතර, කහතුඩුව ගොවිජන කේන්ද්‍රය ඉදි කිරීම සඳහා කහතුඩුව කනිෂ්ඨ විදුහල් ක්‍රීඩා පිටිය ලෙස පාවිච්චි කරන ඉඩමෙන් පර්චස් 30ක බුක්තිය කහතුඩුව ගොවිජන සේවා කාරක සභාවේ විධායක ලේකම්ට භාර දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයටත් එම ඉඩම පවරා ගැනීම සිදුකර නොතිබුණි. තවද, හෝමාගම, කොස්ගම, මහරගම, කොලොන්නාව සහ පාදුක්ක ගොවිජන සේවා කාරක පිහිටුවා ඇති ඉඩම්, පවරාගැනීමටද සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි. | ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත් පවරාදී නොමැති බව | මධ්‍යස්ථානයට අයත් ඉඩම පවරාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවි සෙවන සඳහා පාදුක්ක ගොවිජන සේවා කාරක සභාවට පවරාදී තිබුණු පර්චස් 82 කින් යුතු "දඹෝර" ඉඩම ඵලදායි ආර්ථික කටයුත්තක යෙදවීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | විධිමත් පරිදි ඵලදායි ආර්ථික කටයුත්තක යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කැස්බෑව ගොවිජන සේවා කාරක සභාවට අයත් අලෙවිසැල් 11 ට අදාලව බදුකරුවන් සමඟ එළඹි බදු ගිවිසුම් 2020 සහ 2021 වර්ෂවලදී අවසන් වී තිබුණ අතර ගොවිජන සංවර්ධන | ගොවි සංවිධාන කිහිපයක් මේවන විටත් නව ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර ඇති බව සහ සියළුම ගොවි සංවිධාන සමග | විවෘත තරගකාරි ප්‍රසම්පාදනය අනුව කටයුතු කරමින් කාරක සභාවේ ආදායම් ඉපයීම් වැඩිකර ගැනිම සඳහා |

| | | | |
|---|---|---|---|
| | සහකාර කොමසාරිස්ගේ උපදෙස් පරිදි තරඟකාරී මිල ගණන් කැඳවා අලෙවිසැල් බදු දීමට කටයුතු කර නොතිබුණි. තවද, 2021 වර්ෂයේදී සභාව අනුමත කළ නව කුලී මුදල යටතේ ගිවිසුම්වලට එළඹීමෙන්ද තොරව 2024 ජූනි 03 දින වනවිටත් අලෙවිසැල් පවත්වා ගෙන යාමට පැරණි බදුකරුවන්ටම ඉඩහැර තිබුණි. | ගිවිසුම්ගත වීමට කටයුතු කරන බව. ඉහළ දැමූ බදු කුළිය සම්බන්ධව අභියාචනයක් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධව විසඳුමක් දෙන තෙක් 2024 වර්ෂයට අදාල කුළිය ජනවාරි මාසයේ සිට ගෙවීමට එකඟ වූ අතර මේ වන විට 2024 වර්ෂයට අදාල කුළිය නියමිත ලෙස ගෙවන බව. | කටයුතු කළ යුතුය. |
| (ඇ) | ටෙන්ඩර් කැඳවීම සිදු නොකිරීම, බදු කාලය අවිධිමත් ලෙස දීර්ඝ කිරීම හා විධිමත් තක්සේරුවක් මත බදු ගාස්තු තීරණය කිරීමෙන් තොරව කොස්ගම ගොවිජන සේවා මධ්‍යස්ථානය සතු අක්කර 1 ක ඉඩම් ප්‍රමාණයක් පවතින "බොරළුගොඩ ශාලාව වත්ත" නැමති ඉඩම ගිවිසුම් පත්‍රයක් මඟින් මාසිකව බදු ගාස්තුවක් යටතේ ගොවි සංවිධානයට 2009 අගෝස්තු 20 වන දින සිට සමාලෝචිත වර්ෂය දක්වා ලබා දී තිබුණි. | කමිටු තිරණයක් මත එකී ඉඩම බදු පදනම මත ලබාදී ඇති බව සහ ඉදිරියේදී කමිටුව දැනුවත්කර ටෙන්ඩර් කැඳවීම සිදු කරන බව. | විධිමත් පරිදි තක්සේරු කර ටෙවිඩර් කැඳවා බදුදීම තුළින් කාරක සභාවේ අදායම් ඉපයීම් වැඩිකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 02ක 2021, 2022 හා 2023 වර්ෂවල ගෙවත්ත සංවර්ධනය කිරීම සඳහා පිළිවෙලින් රු.97,243ක්, රු.343,600ක් හා රු.114,163ක් වියදම්කර තිබුණද ගෙවතු ආදායම පිළිවෙලින් රු.12,953ක්, රු.26,725ක් හා රු.24,250ක් පමණක් වූ අතර හෝමාගම ගොවිජන සේවා කාරක සභාව විසින් 2021, 2022 හා 2023 වර්ෂ සඳහා ගෙවත්ත සංවර්ධනය කිරිම සඳහා රු.8,160ක්, රු.21,150ක් හා රු.7,370ක් වැය කර තිබුණද කිසිදු ගෙවතු ආදායමක් රැස් කර නොතිබීම මත ගෙවතු සංවර්ධනයට දරන ලද වියදමට සාපේක්ෂව ගෙවතු ආදායම අවම අගයක් ගෙන තිබුණි. | මාලබේ ගොවිජන සේවා කාරක සභාව විසින් ගෙවතු අලංකරණ වැඩසටහන යටතේ ගෙවත්ත සංවර්ධනය කළ බව. කැස්බෑව ගොවිජන සේවා කාරක සභාව විසින් වියදම් සිදු කර ඇත්තේ ආදර්ශ ගෙවත්තක් සැදීමට බැවින් වියදමට සරිලන අදායමක් ලබා ගැනීමට නොහැකි වී ඇති බව. හෝමාගම ගොවිජන සේවා කාරක සභාව විසින් මේ වන විට මධ්‍යස්ථාන භූමියේ ගබඩා ගොඩනැලිල්ලක් ඉදි වෙමින් පවතින බැවින් සහ මධ්‍යස්ථානය තුල තවත් වෙනස්කම් සිදුවීමට ඇති | වියදමට සරිලන ප්‍රතිලාභ ලබාගැනීමට හැකිවන පරිදි විධිමත් සැලසුම් මත වියදම් දැරීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | බැවින් ගෙවත්ත තුල වෙනත් සංවර්ධන කටයුත්තක් හෝ අදායම් ලැබිය හැකි වගාවක් කිරීමට නොහැකි වී ඇති බව. | |
| (ඊ) | වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එනු ලබන ගොවිජන සේවා කාරක සභා 08ක රු.4,540,841ක්වු ලැබිය යුතු ශේෂ 130ක් අයකරගැනීමටත් රු.5,624,730ක්වු ගෙවිය යුතු ශේෂ 73ක් නිරවුල් කිරිමටත් කටයුතු කර නොතිබුණි. | අදාල ශේෂයන් පොත් වලින් ඉවත් කිරිමට අනුමැතිය ඉල්ලා ඇති බව. | ලැබිය යුතු ගිණුම් ශේෂ හා ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට හෝ විධිමත් අනුමැතියක් ලබාගෙන සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (උ) | හෝමාගම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගොඩනැගිලි හා ඉඩම වෙනුවෙන් 2020 මාර්තු 06 දින ලැබුණු රු.3,917,967ක් වු වන්දි මුදල කාරක සභාවේ ජංගම ගිණුම තුල රඳවාගෙන තිබුණි. 2024 ජුනි මස වන විටත් එම වන්දි මුදල ලැබි වසර 04 ක් ඉක්ම ඇතත් වන්දි මුදල ලබාදුන් කාරණය වෙනුවෙන් යෙදවීමට හෝ එකී මුදල ස්ථාවර තැන්පතුවක යොදවාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | උපදෙස් ලැබෙන තුරු කමිටු ගිණුමේ රඳවා තබන ලෙස වාචික උපදෙස් ලැබුනු බැවින් වගකීමක් වශයෙන් ගිණුම් ගත කර ඇති බව සහ මේ වන විට පොහොර ගබඩාවක් ඉදිකිරීමට ඇස්තමේන්තු සකස්කර ඇති බැවින් ඒ සඳහා යෙදවීමට අරමුදල ලබා දීමට කටයුතු කරන බව. | වන්දි මුදල ලබාදුන් කාර්යය ඉටුකරගැනීම වෙනුවෙන් යෙදවීමට කටයුතු කළ යුතු අතර එහි ප්‍රමාදයක් සිදුවන්නේ නම් විධිමත් අනුමැතිය යටතේ සුදුසු ආයෝජන ප්‍රභවයක යෙදවිය යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09යට අදාලව 2023 වර්ෂයේ මහකන්නයේ වී වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 12,173ක් වුවද වගාකල කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 9,057 විය. පුරන්ව ඇති කුඹුරු ඉඩම්වලින් වගාකල හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 2,128ක් වන අතර ඉන් වී වගාකල කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 192 ක් විය. ඒ අනුව සමස්තයක් ලෙස වී වගාකල හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 5,052ක් වගාකර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | වී වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණයම වී වගාව සඳහා යොදා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුරන් කුඹුරු නැවත වගා කිරීමේ වැඩසටහන - 2023 යටතේ ගොවිජන සේවා කාරක සභා 03ක එම කාරක සභාවලට අයත් බල ප්‍රදේශය තුළ පුරන් කුඹුරු අක්කර 57.86 ක් නැවත වගා කිරීම වෙනුවෙන් රු.2,348,316 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද ඉන් අක්කර 39.5 ක් සඳහා රු.1,730,743 ක් පමණක් භාවිතා කර තිබුණි. | අධික වර්ෂාව හේතුවෙන් පුරන් කුඹුරු වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | පුරන් කුඹුරු නැවත වගා කිරීමේ වැඩසටහන වෙනුවෙන් ලබාදුන් ප්‍රතිපාදන උපයෝගිකර ගෙන එම ව්‍යාපෘතියේ අරමුණු සඵල කර ගත යුතුය. |

## 3.5 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාලබේ ගොවිජන සේවා කාරක සභාව විසින් අනවසරෙන් කුඹුරු ඉඩම් ගොඩකිරීම්වලට අදාලව තැනැත්තකුට විරුද්ධව 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 33 වන වගන්තිය හා 32 වන වගන්තිය ප්‍රකාරව අධිකරණයේ නඩු පවරා පසුව නඩුව සමථයකට පත්කර ගැනීම සඳහා පර්චස් එකක් සඳහා රු.20,000 බැගින් පර්චස් 80 ක් සඳහා රු.1,600,000ක් ලබාගෙන කාරක සභා ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. තවද කැස්බෑව ගොවිජන සේවා කාරක සභාව විසින් අනුමැතිය ලබා ගැනීමකින් තොරව ඉදිකිරීමක් සිදුකර ඇති කුඹුරු ඉඩමකට, කුඹුරු ඉඩමක් නොවන බවට සහතිකයක් ලබාදීම සඳහා පර්චස් එකක් සඳහා රු.30,000ක් බැගින් පර්චස් 18.1 කට රු.543,000ක් ලබාගෙන කාරක සභා ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. මෙලෙස පනත ප්‍රකාරව වරදක් සිදු කර ඇති අවස්ථාවලදී, ඊට විරුද්ධව නීතිමය කටයුතු සිදු කිරීම වෙනුවට එම නඩු කටයුතු සමථයකට පත්කරගැනීමට කටයුතු සිදුකර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. | මාලබේ ගොවිජන සේවා කාරක සභාව විසින් නඩුව සමථයකට පත් කර ගැනීමට වගඋත්තරකරු විසින් ගරු අධිකරණයෙන් ඉල්ලා තිබූ ඉල්ලීම සලකා බලා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්තුමා විසින් කටයුතු සිදු කර ඇති බව.<br>කැස්බෑව ගොවිජන සේවා කාරක සභාව විසින් අවසර ලැබීමට පෙර අදාල ඉඩමෙහි ඉදිකිරීමක් සිදුකර තිබීම හේතුවෙන් ඉල්ලුම්කරු කැඳවා කිසියම් ගෙවීමක් කාරක සභාවට ගෙවන ලෙසත් ඒ සඳහා සුදුසු මුදලක් කාරක සභාවට තීරණය කරන ලෙසත් දන්වන ලද නමුත් ගාස්තු තීරණය කල යුතු ක්‍රමවේදයක් සඳහා උපදෙස් ලබාදී නොතිබුණු අතර කාරක සභාව විසින් අදාල ප්‍රදේශයේ ඉඩම්හි වටිනාකම සලකා පර්.01 ක් සඳහා රු.50,000 ක් බැගින් වූ මුදලක් අයකිරීමට තීරණය කළද, පසුව ලද උපදෙස් පරිදි කටයුතු කළ බව. | ගොවිජන සංවර්ධන පනතට අනුකූල නොවන ලෙස කටයුතු කිරීම මත ආරම්භ කරන නඩු කටයුතු පසුව කොළඹ දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් ඉදිරියට රැගෙන නොයා වන්දි මුදල් ලබා ගැනීම වැරදි පූර්වාදර්ශයක් නොවීමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය. |

### 3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණ | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 05ක ට්‍රැක්ටර් රථ 10ක් භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | මේ සම්බන්ධව දිස්ත්‍රික් කාර්යාලයෙන් උපදෙස් ඉල්ලා ඇති බව. | වත්කම් භාවිතා කිරීමට නොහැකි තත්ත්වයේ පවති නම් එම වත්කම් අපහරණයට හෝ අලුත්වැඩියාකර භාවිතයට ගත හැකි නම් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමටද කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03ක බීජ, කෘෂි රසායන, පොහොර හා පැලවලට අදාලව රු.274,888ක්ද, ගොවිජන සේවා සේවා කාරක සභා 04 ක ගොවීන් වෙත බෙදාදීම සඳහා ලැබී තිබුණු කාබනික දියර පොහොර ලීටර් 2993ක්, හා ජෛව දියර පොහොර ලිටර් 457ක් කල් ඉකුත්වී භාවිතයට ගත නොහැකි වී තිබුණි. | කපා හැරිමට අනුමැතිය ඉල්ලා ඇති බව. | දියර පොහොර කල් ඉකුත් වීමට පෙර ගොවීන් අතර බෙදාදීමට නොහැකි නම් වහාම පොහොර ලේකම් කාර්යාලය හරහා දියර පොහොර සැපයුම් සමාගම වෙත ආපසු හරවා යැවීමට කටයුතු කළ යුතුය. |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් කාර්යාලයට හා ගොවිජන සේවා මධ්‍යස්ථාන 09 ට අදාල අනුමත කාර්ය මණ්ඩලය 453ක් ද තත්‍ය කාර්ය මණ්ඩලය 378ක් ද වුයෙන් පුරප්පාඩු 86ක් හා අතිරික්ත 14ක් විය. නමුත් එක් එක් ගොවිජන සේවා මධ්‍යස්ථානයට අදාළව අනුමත කාර්ය මණ්ඩලයක් නිරීක්ෂණය නොවූයෙන් එක් එක් මධ්‍යස්ථානයට අදාලව පුරප්පාඩු/අතිරික්ත කාර්ය මණ්ඩලය හදුනාගත නොහැකි විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | පුරප්පාඩු පිරවීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනයට හෝ කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 09කට අදාලව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් 311ක් පවතින අතර, කෘෂිකර්ම පර්යේෂණ | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| | හා නිෂ්පාදන සහකාරවරුන් 49ක පුරප්පාඩු පැවතුණි. ගොවිජන සේවා කාරක සභා 09 යෙහිම ගොවි බැංකු නිලධාරී සහ ගොවි බැංකු සහායක තනතුරු පුරප්පාඩුව පැවතුණි. | | |
| (ඇ) | කෝට්ටේ ගොවිජන සේවා මධ්‍යස්ථානයට අදාලව වසම් 21ක් පවතිණ අතර අනුමත කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන් 21ක් සිටියද වී වගාකල හැකි කුඹුරු ඉඩම් අක්කර 4 රූඩ් 2ක් එක් වසමකට පමණක් අදාලව පවතිණ අතර කොලොන්නාව ගොවිජන සේවා බල ප්‍රදේශයේ වී වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය කුඹුරු අක්කර 125 ක්ද, කෘ.ප.නි.ස වසම් 17ක් හා එහි කටයුතු සඳහා කෘ.ප.නි.ස.වරුන් 16 ක් සිටින බවද මෙයින් වී වගාකරනු ලබන කුඹුරු ඉඩම්වලින් අක්කර 108 ක් අයත් වන්නේ කෘ.ප.නි.ස වසම් 04 කට පමණක් බවද, කැස්බෑව ගොවිජන සේවා මධ්‍යස්ථානයට අදාලව එකදු කුඹුරු ඉඩමක් හෝ පුරන් කුඹුරු කිසිවක් නොමැති කෘ.ප.නි.ස.වසම් 06 ක් සහ වගාකටයුතු සඳහා යොදාගත නොහැකි පුරන් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් පවතිණ කෘ.ප.නි.ස. වසම් 03 ක් පැවති අතර සෑම කෘ.ප.නි.ස. වසමකම රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් කෘ.ප..නි.ස. නිලධාරියෙක් අනුයුක්ත කර ඇති බව සහ ඒ අනුව වී වගාකළ හැකි කුඹුරු ඉඩම් නොමැති වසම් සඳහා පත්කර ඇති කෘ.ප.නි.ස. වරුන් විධිමත් රාජකාරි කටයුත්තක නිරත නොවන බව නිරීක්ෂණය විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | වසමක් තුළ ක්‍රියාත්මක කුඹුරු ඉඩම් හා අනෙකුත් වගා කටයුතු අනුව අවශ්‍ය කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන් සංඛ්‍යාව සංශෝධනයට හෝ පුරප්පාඩු පිරවීමට හෝ කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 මැයි 04 දිනැති අංක 107 (සංශෝධන 2) දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී මාස තුනක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

හෝමාගම ගොවිජන බැංකුවට අදාළව 2019 වර්ෂයේ ගොවිජන බැංකු මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ මාස 45 ක් ප්‍රමාදවී 2023 දෙසැම්බර් 28 දිනදීය. 2020, 2021 සහ 2022 වර්ෂයේ ගොවිජන බැංකු මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ පිළිවෙලින් මාස 36ක්, මාස 24ක් සහ මාස 12ක් ප්‍රමාදවී 2024 මාර්තු 06 දිනදීය.

## 4.2 ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා දෙකක ණයකරුවන් 86කට අදාලව රු.751,089ක් අයකර ගැනීමට නොහැකිව පවතින අතර එම ණය ශේෂය තුළ වටිනාකම රු.275,476ක්වූ කෘෂි ණය ශේෂ 60 ක් ගොවිජන බැංකු මූල්‍ය වංචාවේ විමර්ෂණ කටයුතුවලට අදාළ ණය ශේෂ බැවින් එම ණය අය නොවීම හේතුවෙන් වටිනාකම රු.67,132ක්වූ ණයකරුවන් 08 දෙනෙකුට නඩු පැවරීම හා වටිනාකම රු.21,314ක්වූ ණයකරුවන් 05 දෙනෙකු විනිශ්චය සභාව වෙත යොමු කිරීම පමණක් සිදු කර තිබුණි. | නඩු විභාග වෙමින් පවතින බව ගොවි බැංකුවක් දන්වා ඇති අතර අනෙක් ගොවි බැංකු විසින් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි | ණය අයකර ගැනීම සඳහා අවශ්‍ය සියළුම ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ගොවිජන බැංකුවක වර්ෂ ගණනක සිට පැවත එන චක්‍රීය අරමුදල් පාලන ගිණුමේ රු.287,171ක් හා චක්‍රීය අරමුදල් පොළී පාලන ගිණුමේ රු.689,507ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ණය අයකර ගත නොහැකි වීම හේතුවෙන් 2010 වර්ෂයෙන් පසු පොළී ගණනය නතර කර තිබුණි. | මේ සම්බන්ධව දිස්ත්‍රික් කාර්යාලයෙන් උපදෙස් ඉල්ලා ඇති බව. | ප්‍රමාණවත් තොරතුරු හා ලේඛන පවත්වාගෙන යායුතු අතර ණය ලබාදීම හා අයකරගැනීම විධිමත් කළයුතුය. |